**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - 2017**

**--------------------------------------**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

----------------------------------

ප්‍රමිතයේ 15 ඡේදය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රාජ්‍ය ප්‍රදාන, හිමිකම් යටතේ වෙනම අයිතමයක් ලෙස හඳුනාගත යුතු වුවද, ජර්මන් රජයේ ප්‍රදාන රු.1,128,190,137 ක්, ජපන් ප්‍රදාන රු.70,849,537 ක් හා රාජ්‍ය ප්‍රදාන රු.863,445,527 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

----------------------------------

(i) පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම ඇස්තමේන්තු කිරීම සඳහා පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය භාවිතා කරන බව සඳහන් කර තිබුණද, ප්‍රමිතයෙහි 75 ඡේදය පරිදි යොදාගත් ආයුගණක උපකල්පන හෙළිදරව් කර නොතිබුණු අතර වර්ෂයට අදාල ආයුගණක ලාභයක් හෝ අලාභයක් හඳුනාගෙන නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 83 ඡේදය ප්‍රකාරව සේවාවෙන් පසු ප්‍රතිලාභ වට්ටම් කිරීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය පදනම්ව වට්ටම් අනුපාතය තීරණය කළයුතු වුවද, සංස්ථාව විසින් කිසිදු පදනමකින් තොරව සියයට 11 ක් ලෙස වට්ටම් අනුපාතය යොදාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21

----------------------------------

(i) ප්‍රමිතයේ 23 (අ) ඡේදය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංස්ථාවේ විදේශ ණයගැතියන් ප්‍රමාණය වූ එක්සත් ජනපද ඩොලර් 20,035 ක් හා ඉන්දියානු රුපියල් 3,346 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර රු. 3,070,427 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට ණය ගැතියන් ඇති වූ වර්ෂයේ අවසාන දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ විදේශ ණයගැතියන් රු.417,416 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 23 (අ) ඡේදය ප්‍රකාරව විදේශ මුදලින් පවත්නා මූල්‍යමය අයිතම වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ පවතින විනිමය අනුපාතය මත පරිවර්තනය කළයුතු වුවත් ලංකා බැංකුවේ වෙන්නායි බැංකු ගිණුමෙහි පවත්නා ශේෂය වන ඉන්දියානු රු.676,658 ක මුදල 2017 දෙසැම්බර් 31 වන දින විනිමය අනුපාතය වූ ඉන්දියානු රුපියලකට ශ්‍රී ලංකා රුපියල් 2.3854 මත පරිවර්තනය නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එම ශේෂය රු.3,654 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඉහත කරුණු හේතුවෙන් හඳුනා ගත යුතු කාලච්ඡේදය සඳහා වූ විදේශ විනිමය විචලන වාසිය වූ රු.3,654 ක අගය ලාභය ගණනය කිරීමේදී හඳුනාගෙන නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 7 ඡේදය හා ආයතනය විසින් හඳුනාගෙන ඇති ප්‍රතිපත්තිය අනුව ආයෝජන අත්පත් කරගත් දින සිට පරිණත වීමට ගතවන කාලය මාස 03 කට අඩු ආයෝජන පමණක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය හැකි වුවත් මාස 03 කට වඩා පරිනත කාලයක් ඇති රු.63,368,597 ක් වටිනා ස්ථාවර තැන්පතු 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල්වලට සමාන අයිතම ලෙස දක්වා තිබුණි.

(ආ) ආයතනය විසින් හඳුනාගෙන ඇති ප්‍රතිපත්තිය අනුව බැංකු අයිරාව ණය මුදලක් ලෙස සලකා ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වුවත් ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති බැංකු අයිරාව වූ රු.5,699,421 ක් මුදල් හා මුදල් සමාන අයිතම යටතේ සෘණ අගයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සය මාසිකව කල් පිරෙන ස්ථාවර තැන්පතු 04 කට අදාළව ලැබිය යුතු පොලී ආදායම ගණනය කිරීමේදී අර්ධ වාර්ෂික පොලී අනුපාතය යොදා ගැනීම වෙනුවට වාර්ෂික පොලී අනුපාතය භාවිතා කිරීම හේතුවෙන් පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම රු.344,481 කින් අධි තක්සේරු වී තිබුණි.

(ආ) සංස්ථාවට අයත් සීදූව පිහිටි ඉඩමෙන් කොටසක් 2005 වර්ෂයේදී විකිණීම මත ඇතිවූ රු.19,997,092 ක් වූ ප්‍රාග්ධන ලාභය රඳවා ගත් ඉපයීම් ගිණුමට බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණි.

(ඇ) මැනුම් කටයුතුවලදී භාවිතා කරන පිරිවැය රු.425,000 ක් වටිනා පවර් ලොගර් නම් වූ උපකරණය, 2016 වර්ෂයේදී අස්ථානගත වී තිබුණ ද යන්ත්‍ර හා උපකරණ ගිණුමෙන් ඉවත් කිරීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 3 දින දක්වාම කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ ගිණුමේ දැක්වෙන ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 1979 වර්ෂයේදී බද්දට ලබාගත් ගොඩනැගිල්ලේ අයිතිය වෙනුවෙන් මාර්ක්ෆෙඩ් ආයතනයට ගෙවන ලද රු.250,000 ක මුදල ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. එම බදු ගිවිසුම 2015 ජුනි 01 දින අවසන් වී එහි අයිතිය නැවත නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබුණ ද ගොඩනැගිලි ගිණුමෙන් එම වටිනාකම සහ අදාළ ක්ෂය වෙන් කිරීම් ඉවත් කිරීමට කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි අගය එම වටිනාකමෙන් සහ ක්ෂය වෙන් කිරීම රු.250,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2017 වසරට අදාළ ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු බද්දට යටත් මුළු ආදායම රු.536,777,714 ක් වුවත්, සංස්ථාව විසින් රු.524,226,609 ක් පමණක් සැලකිල්ලට ගැනීම හේතුවෙන් 2017 වසරට ජාතිය ගොඩනැගීමේ බදු රු.251,022 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) එකතු කළ අගය මත බදුවලට යටත් වන ආදායම ගණනය කිරීමේදී රු.5,722,380 ක් වූ වාහන 04 ක් විකිණීමේ ආදායම සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් 2017 වසරේ සැප්තැම්බර් මාසයට අදාළ එකතු කළ අගය මත බදු ගෙවීම් රු.858,357 කින් අඩුවෙන් ගෙවා තිබුණි. මෙම වාහන කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී යෙදවුම් මත බද්ද ප්‍රතිපූර්ණය කරගෙන තිබූ ඒවා විය.

(උ) රාජ්‍ය බැංකු ජංගම ගිණුමක් සඳහා පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ තැන්පත් නොකර අත රැඳි රු.122,529 ක් අතැති මුදල් (Cash in hand ) ගිණුමකට හර කර දැක්වීම වෙනුවට බැංකුවේ තැන්පත් කරන ලද මුදල් ලෙස මුදල් පොතේ සටහන් කර බැංකු සැසඳුම තුළ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස දක්වා තිබුණි.

(ඌ) 1959 මැයි 29 දින අත්පත් කරගත් ඉඩමක් 2009 වසරේදී ක්‍රීඩාංගනයක් සඳහා හෝමාගම ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී රු.186,563 ක් වූ පොත් වටිනාකම සහ එහි පිහිටි රු.247,441ක් වූ ගොඩනැගිලි වටිනාකම හා එම ගොඩනැගිල්ලට අදාළ රු.235,069 ක ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ත්‍රිකුණාමල ප්‍රතිචිකාශනාගාර විකුණුම් ආදායමට අයත් රු.22,301,224 ක විකුණුම් පිරිවැය වෙනත් මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම නිසා 2017 වසරේ දල ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සංස්ථාව විසින් දීර්ඝ කාලීන කල්බදු ක්‍රමයට විවිධ රාජ්‍ය ආයතනවලින් ලබා ගෙන තිබූ ඉඩම් වෙනුවෙන් රජයට ගෙවිය යුතු රු.122,614,833 ක් ගිණුම් ගතකර නොතිබුණි.

### 2.2.4 අසම්භාව්‍ය බැරකම්

----------------------

පැමිණිලි පාර්ශවයට රු.මිලියන 10 ක්,රු.1,783,587 ක් හා රු.80,311 ක් ගෙවීමට නියෝග කරන ලද නඩු තීන්දු තුනට එරෙහිව සංස්ථාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට හා මහාධිකරණයට අභියාචනා කර ඇති නමුත් එම නඩු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.5 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගුවන් කාල ණයහිමි උපලේඛනවල දැක්වෙන ශේෂය රු.12,824,165 ක් වුවද, ගිණුම් අංශයේ ගුවන් කාල ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු.12,749,748 ක් විය. ඒ අනුව ගුවන් කාල ණයහිමි පාලන ගිණුමේ ශේෂය හා ණය හිමි උපලේඛනවල ශේෂ අතර රු.74,417 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගුවන් කාල ණයගැති උපලේඛනවල දැක්වෙන ශේෂය රු.226,557,638 ක් වුවද, ගිණුම් අංශයේ ගුවන් කාල ණයගැති පාලන ගිණුමේ ශේෂය රු.233,214,273 ක් විය. ඒ අනුව ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ණයගැති උපලේඛනවල ශේෂ එකතුව අතර රු.6,656,635 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු තැන්පතුවලට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා විගණනය වෙත ලබාදුන් උපලේඛන අනුව ශේෂය සැසදීමේදී එකතුව රු.35,720,721 ක හඳුනා නොගත් ශේෂ ඇතුළත් කර එම උපලේඛන අනුව ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන්ට සමාන කර ඉදිරිපත්කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම සම්බන්ධව සිදුකළ විගණනයේදී බැංකු ශේෂ තහවුරු කිරීම් අනුව අදාළ බැංකු ගිණුමේ ශේෂය ඉන්දියානු රු.179,278 ක් වූ අතර, සංස්ථාවේ ගිණුම් අනුව එම ශේෂය ඉන්දියානු රු.182,176 ක් විය.

**2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම්වල වූ පහත දැක්වෙන එක් එක් වත්කම්, වගකීම් හා ගෙවීම්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ඉඩම් | 7,764,234 | ස්ථාවර වත්කම් ලේඛනය, භෞතික සත්‍යාපන වාර්තා |
| (ආ) | ගොඩනැගිලි | 168,923,977 | භෞතික සත්‍යාපන වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය, විදේශීය රට වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම් පිළිබඳ ලිපිගොනු |
| (ඇ) | ප්‍රධාන කාර්යාලීය නව ගොඩනැගිල්ල | 189,338,449 | ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ අනුමත සැලැසුම, වියදම් ඇස්තමේන්තු, කළ වැඩ සහතික කිරීම්, ඉන්වොයිස් පත් |
| (ඈ) | ලක්හඬ ශාඛා වෙළඳ ණයගැතියෝ | 12,807,802 | ලිපි ගොනු විස්තර හා වටිනාකම සෑදී ඇති ආකාරය දැක්වෙන උපලේඛන |
| (ඉ) | ගෙවීම් | 33,613,157 | ගෙවීම්වලට අදාළ වවුචර් 45 ක් |
| (ඊ) | ඉන්දියානු රාජ්‍ය බැංකු ගිණුම් ශේෂය | 182,176 | ශේෂ තහවුරු කිරීම. |
| | | 412,629,795 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ නියාමන කොමිෂමට ගෙවිය යුතු එකතුව රු.149,420,035 ක් වූ ශේෂය තුළ 1981 සිට එනම් වසර 36 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පවතින ශේෂ පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,267,095 ක් වූ විදේශීය ණයගැති ශේෂ තුල ඇතුලත් රු.59,692,746 ක් වූ වර්ෂ 10 කට වඩා පැරණි ණය නිරවුල් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 82,612,880 ක් වූ වෙළෙඳ ණයගැතියන් 136 දෙනෙකු වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යවා තිබූ අතර, ඉන් රු.1,063,687 ක් වටිනා ණයගැතියන් හත්දෙනෙකු පමණක් පිළිතුරු එවා තිබූ අතර, එම ණයගැතියන් විසින් සංස්ථාවට ගෙවීමට ණය ශේෂ නොමැති බව සනාථ කර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2013 අප්‍රේල් 30 දිනෙන් සංශෝධිත 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | මෙම පනතේ 4(i) , (ii) වගන්ති අනුව ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමේදී අදාළ මාසයේ බදු ඊළඟට එළඹෙන මාසයේ 20 දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අතර, පනතේ 8 (ඩී) වගන්තිය අනුව ඒ ඒ කාර්තුවට අදාළ බදු වාර්තා ඊළඟට එළඹෙන කාර්තුවේ 20 දින හෝ එදිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතුය. නමුත් සංස්ථාව සෑම මසකම ජාතිය ගොඩනැගීමේ බදු ගෙවා තිබුණේ ගෙවිය යුතු දිනට මාස 02 ක්ද ඉක්මවීමෙන් පසුවය. එමෙන්ම කාර්තුමය බදු වාර්තාද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දින යවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි 177 | ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් රු.1,002,063 ක් වූ මුළු සෘජු හර කිරීම් 2018 මැයි 31 දින විටත් නිරවුල් කර නොතිබුණි. එම ශේෂය තුළ 2016 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන රු.49,318 ක ශේෂයක්ද විය. |

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 396 (ii), (iii) | 2018 මැයි 31 දින වන විට වලංගු කාලය අවසන් වී තිබූ මාස 06 ඉක්ම වී තිබූ නමුත් ගෙවීමට බැංකුවට ඉදිරිපත් නොකළ රු.918,136 ක් වටිනා චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය (අ),(ආ) වගන්ති | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කර තිබිය යුතු වුවද සංස්ථාව විසින් 2017 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 3 වැනි උපලේඛනය 2.11 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර ඒ වෙනුවට පරිගණකය මඟින් ස්ථාවර වත්කම් ලොගණයක් පවත්වාගෙන ගොස් තිබුණද එම ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම්, ගොඩනැගිලි, වාහන,විදුලි උත්පාදන යන්ත්‍ර(ජෙනරේටර්), ට්‍රාන්ස්මීටර් වැනි වැදගත් අයිතම රාශියකට අදාළ විස්තර අන්තර්ගත කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 7.2 ඡේදය | 2017 දෙසැම්බර් 31 දිනට රු.27,677,392 ක අගයක් තොග වශයෙන් පවතින සංස්ථාව විසින් තොග වාර්තා නඩත්තු කරනුයේ පොත් පත් භාවිතයෙන් පමණක් (manually) වන අතර, අදාළ රෙගුලාසිය ප්‍රකාර පරිගණකගත ගිණුම් පද්ධතියක් හෝ අවම වශයෙන් පැතුරුම්පත් පැකේජ (MS-Excel වැනි) හෝ භාවිතයෙන් තොග වාර්තා පවත්වා ගැනීමක් සිදු නොකෙරෙන බැවින් අවසන් තොග වාර්තා ලබාගැනීමට සැලකිය යුතු කාලයක් ගත වන බව නිරීක්ෂණය විය. |
| | (ii) 7.4.5 වගන්තිය | සංස්ථාව විසින් වාර්ෂිකව කමිටු පත් කර සෑම ස්ථාවර වත්කමකම භෞතික පැවැත්ම සත්‍යාපනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වාහන භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. |
| (උ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (i) | නිල වාහන හෝ වාහන දීමනා සඳහා හිමිකාරත්වයක් ලැබීමට නම් එම පුද්ගලයා 2006 වසරේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක එම්එස්ඩී 03 ප්‍රකාරව HM 1-1 සනය හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරන නිලධාරියකු විය යුතු මුත්, දැනට සංස්ථාවේ එම වැටුප් තලයට අන්තර්ග්‍රහනය කර නොමැති අධ්‍යක්ෂවරුන්ට 2017 දෙසැම්බර් 01 සිට මසකට රු.20,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |

(ii) මෙම දීමනාව ගෙවූ අය අතර වැටුප් තලයට අන්තර්ග්‍රහනය කිරීමට සුදුසුකම් සපුරා නොමැති සහ ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබූ දැනට අධ්‍යක්ෂ තනතුරේ කටයුතු කරමින් සිටින අධ්‍යක්ෂවරයකුද වන බව නිරීක්ෂණය විය.

(ඌ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය

අබලන් වූ වාහන හඳුනාගෙන අපහරණය කිරීම සඳහා කටයුතු කළයුතු නමුත් වසර 2 සිට වසර 10 ක් දක්වා අබලන්ව ධාවනයෙන් ඉවත් කර තිබෙන ප්‍රත්‍යාගණන අගය රු.1,300,000 ක් වූ වාහන 2 ක් සහ පිරිවැය හඳුනාගත නොහැකි වාහනයක් චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,383,395 ක ලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වසරේ ලාභය රු.55,217,495 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,165,900 ක වර්ධනයක් එනම් සියයට 29 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වෙනත් මෙහෙයුම් ආදායම් රු. 22,801,224 කින් එනම් සියයට 33 කින් වැඩි වීම ශුද්ධ ලාභය වැඩි වීමට ප්‍රධාන හේතුවක් වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂය හා 2014 වර්ෂයන්හීදී ශුද්ධ අලාභයක් ඇතිවී තිබූ අතර, 2015, 2016 හා සමාලෝචිත වර්ෂවලදී ශුද්ධ ලාභයක් ඇතිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2016 වර්ෂයේදී රු.813,039,252 ක් වූ දායකත්වය 2017 වසරේදී රු.812,076,634 ක් දක්වා අඩුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දැක්වෙන සංඛ්‍යාත්මක අගයන් අනුව ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.77 ක් හා 1.71 ක් වුවද ජංගම වත්කම්වල ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 02 සිට වර්ෂ 42ක් දක්වා වූ පැරණි දේශීය ණයගැති ශේෂ රු. 53,413,844 ක් හා විදේශීය ණයගැති ශේෂ රු.61,918,484 ක් ඇතුළත් වීමෙන් ණය අයකර ගැනීමේ හැකියාවක් සහ ද්‍රවශීලතාවයක් නොපවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 6.24 සිට සියයට 10.81 දක්වා වැඩි වී තිබූ අතර, ත්‍රිකුණාමල විකාශනාගාරයේ විකුණුම් ආදායමට අදාළ විකුණුම් පිරිවැය අනෙකුත් මෙහෙයුම් පිරිවැය යටතේ දක්වා තිබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) පෙර වසර සමඟ සැසඳීමේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 8.3 සිට සියයට 10.82 දක්වා වැඩි වී තිබූ අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් විවිධ ආදායම් වැඩි වී තිබීම මෙයට හේතු වී තිබුණි.

**3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්**

-----------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පීපල්ස් ට්‍රස්ට් ක්‍රෙඩිට් ඉන්වෙස්ට්මන්ට් සමාගමෙන් සංස්ථාවේ ප්‍රචාරණය කරන ලද වැඩසටහන් සඳහා ලැබිය යුතු රු.150,000 අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණ ද, විත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් තිබීම හේතුවෙන් නඩුව පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ආ) ලංකා සිමෙන්ති සමාගමේ වැඩසටහන් ප්‍රචාරණය කිරීම වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු රු.471,715 ක් අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව සංස්ථාව විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණ ද රිට් ආඥාවක් ගැනීමට විත්තිකරුගේ වත්කම් ඉදිරිපත් කරන ලෙස අධිකරණයෙන් කරන ලද නියෝගයට අනුව සමාගමේ වත්කමක් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට සංස්ථාව ක්‍රියා නොකිරීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ඇ) අලෙවි විධායක නිලධාරියකු විසින් අවස්ථා 02 කදී සිදුකරන ලද වංචා හේතුවෙන් රු.4,716,813 ක් හා රු.7,551,750 ක් වූ මුදල් අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් කොළඹ දිසා අධිකරණයේ සහ කොළඹ පළාත්බද මහාධිකරණයේ නඩු 02 ක් පවරා තිබුණ ද විත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් ඇති නිසා ඉහත නඩු වසර 03කට වැඩි කාලයක් විභාගයට නොගෙන බහා තිබුණි.

(ඈ) ගිරාඳුරුකෝට්ටේ ප්‍රජා ගුවන් විදුලියේ සේවිකාවකට අර්ථසාධක මුදල් නොගෙවීමට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුවේ තීන්දුවෙන් රු.80,311 ක දායක මුදල් සහ අධිභාරය ලෙස රු.80,311 ක් ගෙවන ලෙස දුන් නියෝගයට එරෙහිව සංස්ථාව විසින් කොළඹ පළාත්බද මහාධිකරණයට අභියාචනය කර තිබූ අතර, මෙම නඩුව වෙනුවෙන් නඩු ගාස්තු සඳහා පමණක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.245,000 ක් එනම් ගෙවිය යුතුව තිබූ වන්දි මුදල මෙන් තුන් ගුණයකටත් වැඩියෙන් ගෙවා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්යසාධනය**

------------------

**4.1.1 සැලසුම් කිරීම**

----------------

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(6) වගන්තියට අනුව ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කළයුතු අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව 2017-2019 කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2012-2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් 1974 වර්ෂයේ සිට මිලදී ගත් වත්කම්වලින් විකුණා හෝ භාවිතයෙන් ඉවත් කර තිබුණු වත්කම්වල පිරිවැය හඳුනාගත හැකි ආකාරයට ලේඛන නඩත්තු නොකිරීම නිසා එකී වත්කම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් ශේෂය හා භෞතිකව ආයතනයේ පවතින වත්කම්වල වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා වගකිව යුතු පාර්ශවයන් වාර්තාවේ දින දක්වාම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගබඩා අංක 02 හි විගණනයට ලබාදුන් තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව භාවිතයට නොගන්නා භාණ්ඩ කිහිපයක් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් බව සඳහන් කර තිබුණද, එලෙස අපහරණය කළයුතු භාණ්ඩ මොනවාද යන්න තොග ගණන් ගැනීමේ පත්‍රිකාවල සටහන් කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා සංස්ථාව විසින් ලබාගත් බැංකු අයිරා වෙනුවෙන් රු.5,419,200 ක අයිරා පොලියක් ගෙවා තිබූ අතර, ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාම වෙනුවෙන් ලද පොලී ආදායම රු.4,868,900 ක් විය. ඒ අනුව අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර අයිරා පවත්වාගෙන යාමෙන් සංස්ථාවට අහිමි වූ මුදල රු.550,300 ක් බව නිරීක්ෂණය විය.

(ඈ) දැනට සංස්ථා සේවයේ ඉල්ලා අස්වී ඇති, සංස්ථා සේවයේ යෙදී සිටියදී වෙනත් ආයතනවලට වරින් වර නිදහස් කර තිබූ පුද්ගලයකු සඳහා 2004 වර්ෂයේ සිට 2009 දක්වා ගෙවා තිබූ ප්‍රතිපූර්ණය කරගත යුතු රු.144,722 ක මුදල විගණිත දින වූ 2018 සැප්තැම්බර් 03 වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඉ) වසර 21 කට වඩා පැරණි රු.221,965 ක මුදල් වංචාවක් සහ 2007 වර්ෂයේ සිදුව තිබූ රු.281,110 ක තවත් එවැනිම වංචාවක් හේතුවෙන් ආයතනයට අලාභයක් සිදු වී ඇති බවට තහවුරු වී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අදාළ හානි හා පාඩු නිරවුල් කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඊ) ණයවර ලිපි විවෘත කිරීම සඳහා ආරම්භ කරන ලදැයි පැවසෙන බැංකු ගිණුමක රු.මිලියන 153ට වැඩි මුදලක් වර්ෂය පුරාම පවත්වාගෙන ගොස් තිබූ අතර, එම මුදල බැංකු ගිණුමෙහි පවත්වාගෙන යාම වෙනුවෙන් කිසිදු පොලී ආදායමක් ලැබී නොතිබුණි. එම මුදල් සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණේ නම් අවම වශයෙන් රු.14,356,565 ක පොලී ආදායමක් ඉපයීමට සංස්ථාවට හැකියාව තිබුණි.

(උ) සීනෝර් (CEYNOR) ආයතනය පිළිබඳව ගුවන් විදුලි සංස්ථාවේ විකාශය වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් සීනෝර් (CEYNOR) ආයතනයේ හිටපු සභාපති වරයෙකුට අපහාස වූ බව පවසමින් එම සභාපතිවරයා විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබූ අතර, ඒ අනුව සංස්ථාවට රු.මිලියන 10 ක් ගෙවීමට නියම වී ඇත. මේ අනුව සංස්ථාව විසින් සංස්ථාවේ අරමුණුවල ඇතුළත් පරිදි ආචාර ධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන් විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම හා වගකීමෙන් යුතුව සමබර තොරතුරු ලබාදීම යන අරමුණු කඩ වන අයුරින් කටයුතු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

තොග සමීක්ෂණ කටයුතු සඳහා සහභාගි වූ 2017 පෙබරවාරි 17 දිනය තුළ විගණනය විසින් තොග අයිතම් 99 ක ගණනය කිරීම් නිරීක්ෂණය කළ අතර, ඒ අතරින් අයිතම 12 ක පොත් ශේෂය හා භෞතික ශේෂය අතර, වෙනස්කම් නිරීක්ෂණය වූ නමුත් විගණනයට ඉදිරිපත් කළ භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව මෙම තොග වෙනස්කම් සඳහන්ව නොතිබූ අතර, භෞතික තොග ශේෂයක් හා පොත් ශේෂයන් සමාන ලෙස දක්වා තිබුණි. එසේම තොග සමීක්ෂණයේදී විගණනයට නිරීක්ෂණය වූ ගබඩා අංක 01 හි පැවති පාවිච්චියට නොගන්නා විදුලි උපාංග තොග අයිතම 19 ක් ද අදාළ වාර්ෂික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන්ව නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරමින් සිටි නිලධාරියා 2015 ජනවාරි 19 දින සිට එම තනතුරෙන් මුදාහැර තිබුණ ද, ගුවන් විදුලි සංස්ථා පනතේ 19(3)(ආ) වගන්තිය ප්‍රකාරව එම නිලධාරියා පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පිහිටුවා නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2015 ඔක්තෝම්බර් 19 දින සිට සංස්ථාවේ උපදේශක තනතුරක පිහිටුවා තිබූ නමුත්, ඔහු විසින් එම තනතුර භාර නොගන්නා බව දැනුම් දී තිබුණි. එහෙත් අධ්‍යක්ෂ ජනරාල් වරයෙකුට හිමි නිල නිවාස, නිල වාහන, ඉන්ධන, වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා දුරකථන දීමනා සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,227,353 ක් ගෙවීම් කර තිබුණි. එම නිලධාරියා විශ්‍රාම යාමෙන් පසු සේවා කාලය මාස 06 ක් සඳහා කැබිනට් අනුමැතිය ඇතිව දීර්ඝ කර තිබූ අතර, නිශ්චිත කාර්යභාරයක් නොමැතිව විශ්‍රාම යාමට පෙර තිබූ වැටුප සහ වෙනත් පහසුකම්ද අනුමත කර තිබුණි.

(ආ) ස්පාඤ්ඤයේ සැපයුම්කාර ආයතනයේ විකුණුම් කළමනාකරුගේ 2017 ජනවාරි 25 දිනැති ලිපිය අනුව ශ්‍රව්‍ය මිශ්‍රක පරිහරණය පිළිබඳ කර්මාන්තශාලා පුහුණුවට සංස්ථාව වෙනුවෙන් සහභාගි වන නිලධාරි දෙදෙනාගේ සියලු වියදම් ස්පාඤ්ඤ සැපයුම්කරු විසින් දරන දක්වා තිබුණ ද, දේශීය නියෝජිත ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂකගේ ලිපියක් පදනම් කරගෙන නිලධාරීන් දෙදෙනෙකු සඳහා ආහාර වියදම් වශයෙන් රු.341,848 ක් ගෙවා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

2016 වර්ෂයේදී ප්‍රධාන කාර්යාල සම්බන්ධතා මැදිරි අංක $C_1 - C_{12}$ නවීකරණය ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදීම මැදිරි සඳහා අවශ්‍යතාවය අනුව ශ්‍රව්‍ය මිශ්‍රක ( Mixer Console ) 12 ක් මිලදී ගැනීමට සැලසුම් කර ඒ සඳහා අරමුදල් වෙන්කර තිබියදී 2016 වර්ෂයේදී mixer console 06 ක් සහ 2017 තවත් 06 ක් මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් ආයතනයට රු.6,452,319 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.6 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

2017 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු.මිලියන 214.3ක් ලැබී තිබුණ ද, ගෙවීම් වවුචර අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වැය කර තිබුණේ රු.මිලියන 175.6 ක් පමණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා ලද රාජ්‍ය ප්‍රදාන වලින් සියයට 18 ක් පමණ මුදලක් ඉතිරිව පැවතුණි.

## 4.7 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉරණවිල පිහිටා තිබූ ඇමරිකන් හඩ ගුවන් විදුලි ආයතනය පාවිච්චි කරන ලද සංස්ථාවට භාරදී ඇති ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කෙටි තරංග ට්‍රාන්ස්මීටර යන්ත්‍රයක් විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 3 දක්වා කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිසි ආරක්ෂාවද නොමැතිව ත්‍රිකුණාමලය සම්ප්‍රේෂණාගාර භූමියේ ගබඩා කර තිබුණි.

(ආ) අලුත්වැඩියා කර ධාවනයට යොදාගත හැකිව තිබූ මෝටර් රථයක් වසර 1 ½ ක් මුළුල්ලේ නිෂ්කාර්යව කොළඹ ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ පැවතුණි.

## 4.8 අනාර්ථික ගනුදෙනු

නියමිත දිනට බදු නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තා අනුව විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 17 වන විට හිඟ ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බදු, එකතු කළ වටිනාකම මත බදු ප්‍රමාණය රු.90,054,857 ක් හා ඊට අදාළ රු.51,684,603 ක් වූ මුළු දඩ මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබුණි.

## 4.9 හඳුනාගන්නා ලද පාඩු

2018 මාර්තු මස හපුතලේ විකාශනාගාර පරිශ්‍රයේ තිබූ රූපවාහිනී ආයතනයකට අයත් කේබල් ආරක්ෂා කිරීමේ වගකීම ගුවන් විදුලි සංස්ථාවට පැවරී තිබූ ආර්එෆ් කේබලයක කොටසක් අනවසරයෙන් කපාගෙන යාම පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබුණ ද, අඟල් 3 ½ ක පමණ විශ්කම්භයක් ඇති මෙම තඹ කම්බිය අස්ථානගත වීමේ පාඩුව තක්සේරු කර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට විගණිත දින වූ 2018 සැප්තැම්බර් 03 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුවන් විදුලි දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය වර්තමානයේ ගුවන්විදුලි සංස්ථාව පරිහරණය කරන කොළඹ ඇති හෙක්ටයාර 2.5036 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම 1949 වර්ෂයේ සිට බුක්ති විඳින නමුත් මේ දක්වා නීත්‍යානුකූලව පවරා ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 ඡේදය පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් වලදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර ඇති බව සනාථ කරගැනීම ප්‍රසම්පාදන කමිටු නිලධාරීන්ගේ වගකීම් හා කාර්යය භාරයට ඇතුළත් වුවත් වගකිව යුතු නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීම් ලබා නොගෙන සංස්ථාවට සින්නක්කරව අයිති පැරණි ගොඩනැගිල්ලක් සහිත පර්චස් 23 ක වපසරියකින් යුත් "අනිවත්ත බහිරව කන්ද " ඉඩමට මීටර් 500 ක දුරින් තිබියදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉඩමක කඳුරට සේවය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2017 දෙසැම්බර් 31 දින වනවිට කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.1,579,442 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ආයෝජන මණ්ඩලයෙන් ලබා දෙන ලද ධාවන තත්වයේ පවතින වාහනයක් 2010 වර්ෂයේදී රු.2,300,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 3 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4.11 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්**

---------------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය අනුව රාජ්‍ය සංස්ථාවල සේවකයන් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙනත් ආයතනයට මුදාහැරිය නොහැකි නමුත් පාලක (ග්‍රාමීය) නිලධාරියකු හා පළමු ශ්‍රේණියේ වාර්තාකරුවකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව වෙනත් අමාත්‍යාංශ දෙකකට මුදාහැර තිබුණි.

**4.12 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වන පරිදි නව බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටිය විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු වන විටත් අනුමත කරගෙන නොතිබුණි.

(ආ) ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 803 ක් වූ අතර ඒ තුල වූ අතිරික්ත කාර්ය මණ්ඩලය 302 ක් විය.

(ඇ) සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 03ක් එනම්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) යන තනතුරු වර්ෂ 03ත් 09ත් අතර කාලයක සිට පුරප්පාඩුව පවතී. එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු), අධ්‍යක්ෂ ඉංජිනේරු (මැදිරි), අධිකාරි ඉංජිනේරු හා ඉංජිනේරු යන තනතුරුවල පුරප්පාඩු 08 ක් අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා පුරප්පාඩුව පවතී. ඉංජිනේරු අංශයේ කාර්යභාරය ගුණාත්මක ලෙස ඉටු නොවීමට මෙම පුරප්පාඩු සලකා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අනුමත නොවන තනතුරු 47 ක් සඳහා කාර්ය මණ්ඩලය 227 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පවත්නා බඳවා ගැනීමේ පරිපාටියේ 06 වන ඡේදයට අනුව අභ්‍යන්තර අයදුම්කරුවකු ඉංජිනේරු තනතුරට පත් කිරීමේදී සංස්ථාවේ පළමු ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වුවද, 1985 වර්ෂයේදී හා 2002 වර්ෂයේදී පළමු ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ නොකළ නිලධාරීන් දෙදෙනෙකු ඉංජිනේරු තනතුරට බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**4.13 වෙළඳපොල කොටස**

-----------------------

ලංකා අලෙවි පර්යේෂණ කාර්යාංශයේ (LMRB) වාර්තාව අනුව ගුවන් විදුලි නාලිකා 29 ක් අතරින් 2017 සැප්තැම්බර් වන විට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් පවත්වාගෙන යන ප්‍රධාන දේශීය සිංහල සේවා 08 න් සිංහල ජාතික සේවය 10 වන ස්ථානයේ සේවා පැවති අතර අනෙකුත් සේවා 7 ට ඊට පහල ස්ථානවල පැවතුණි. ප්‍රාදේශීය සේවා අතුරින් රුහුණු සේවය 24 වැනි ස්ථානයේ පසුවිය.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය, ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංස්ථාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක, එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම් සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රාග්ධන දායකත්වයෙන් සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් සඳහා පමණක් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, පුනරාවර්තන දායකයෙන් සිදුකරනු ලබන හා සංස්ථා අරමුදල් වලින්ම සිදුකරනු ලබන ප්‍රසම්පාදනයන් ද ඇතුළත් වන ලෙස අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහාවත් වන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ නිසා වර්ෂයකට වැඩි කාලයක් ගතවන ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදනයන් හා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද එහෙත් මේ දක්වා කමිටු නිර්දේශ ක්‍රියාත්මක නොකළ ප්‍රසම්පාදනයන් කිසිදු ඇගයීමකට ලක් නොවී තිබුණි.

(ආ) 2016 හා 2017 වර්ෂවලදී ප්‍රධාන කාර්යාලයේ සම්බන්ධතා මැදිරි නවීකරණය හා හපුතලේ FM සම්ප්‍රේෂණාගාරයේ නවීකරණය සඳහා පිළිවෙලින් රු.මිලියන 80 හා රු.මිලියන 193.75 ප්‍රසම්පාදනයන් සැලසුම් කර තිබුණ ද, 2017 අවසන් වන විටත් පිළිවෙලින් රු.මිලියන 43 හා රු.මිලියන 88.7 ප්‍රසම්පාදන පමණක් ඉටු කිරීමෙන් පිළිවෙලින් රු.මිලියන 37 හා රු.මිලියන 105.05 ක ප්‍රසම්පාදන සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි.

(ඇ) වාර්ෂිකව රු.මිලියන 200 ආසන්න වටිනාකමකින් යුත් ප්‍රසම්පාදන කාර්යයන් සංස්ථාව විසින් සිදුකරනු ලැබුවද ප්‍රසම්පාදනය සඳහා වෙනම අංශයක් සංවිධානය නොවීම අභ්‍යන්තර පාලනය දුර්වල වීමට වඩාත් බලපා තිබුණි. මේ අනුව ප්‍රසම්පාදනයේදී වැරදි සිදුවීමේ අවදානම අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති, පිළිවෙත්, පරිචයන් හා සංවිධාන ව්‍යුහයන් වැනි අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම සිදුකර නොතිබුණි.

## 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------------

2016 විගණන වාර්තාවේ වූ නොවිසඳී ඇති ඡේදයන් පහත පරිදි වේ.

(අ) පුත්තූර්හි ඇන්ටනා කුළුන ඉදිකිරීමේ කටයුතු ඉදි කිරීමේ මූල්‍ය හා තාක්ෂණික හැකියාව නොසලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2011 ජූලි 16 දින හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත රු. 9,126,933 ගෙවා තිබූ අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීමෙන් තොරව කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. ගෙවූ අත්තිකාරම් මුදලින් රු. 4,348,041 පමණක් සංස්ථාවට ආපසු ගෙවීම නිසා රු.4,778,892 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) 1996 වර්ෂයේදී මීටර් 60 ක් හා මීටර් 100 ක් උස ඇන්ටනා කුළුනු 2ක් ගෙන්වීම සඳහා රු.23,119,683 ක් වැයකර තිබුණු අතර, කුළුනු සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් ලෙස රු.2,568,000 ක් ගෙවා තිබුණි. සවිකළ යුතු ස්ථාන තීරණය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කුළුනු සවිකර නොතිබූ අතර, ඒකල භූමියේ අනාරක්ෂිතව පැවතුණි.

(ඇ) සංස්ථාව විසින් රු.860,000 ක් ගෙවා මිලට ගෙන තිබුණු නිවාස දෙකක් (අනුරාධපුර හා මහනුවර) සඳහා පැවරුම් සහතික ලබාගෙන නිසි පරිදි අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 යෙහි 07 ඡේදය අනුව යම් දේපළකින් අනාගත ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒ නම් සහ එම දේපළ පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගත යුතු වුවත් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.2,200,000 ක රක්ෂිත වටිනාකමක් සහිත අංක 058-6222 දරන මෝටර් රථය 2014 සිට සංස්ථාව විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද එය ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වසර 10 කට වඩා වැඩි කාලයක සිට අබලන්ව ධාවනයෙන් ඉවත් කර ඒකල සම්ප්‍රේෂණාගාර භූමියේ ගාල් කර තිබෙන මහවැලි අධිකාරියෙන් ලබා දෙන ලද අංක ශ්‍රී 60-355 දරන වාහනය 2010 වර්ෂයේදී රු. 150,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද මේ දක්වා එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම නිසා එය අපහරණය කිරීමට පවා නොහැකිව අකර්මන්‍යව තිබුණි.

(ඊ) 1989 වර්ෂයේදී ජපාන රූපවාහිනී සහ ජපාන ගුවන් විදුලි ආයතනයේ (NHK) ආධාර ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘති අවසානයේදී සම්ප්‍රේෂණාගාර ගොඩනැගිල්ල හා සියලුම යන්ත්‍රෝපකරණ 1993 වර්ෂයේදී ගුවන් විදුලි සංස්ථා ප්‍රධාන කාර්යාලයට භාර දී තිබුණි. එම ඉඩම හා ගොඩනැගිලි 2011 ජූලි 29 දිනැති තක්සේරු වාර්තාව අනුව රු.960,000,000 කට තක්සේරු කර තිබුණද කිසිදු වත්කමක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ව්‍යාපෘතියට අදාළ කිසිදු ලිපි ගොනුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. .

(ඇ) ගිවිසුම ප්‍රකාරව බදු කුලී නොගෙවීම නිසා සංස්ථාවට අයත් නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනයේ බදුකරුට විරුද්ධව නඩු පැවරීමෙන් බදුකරු නිවහනින් ඉවත් කර තිබුණ ද 2005 වර්ෂයේ සිට 2014 වර්ෂයේ පෙබරවාරි දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු.5,106,500 ක බදුකුලී සහ බදු ගැණුම්කරුගෙන් දේපළෙහි අයිතිය නැවත ලබා ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට දරා තිබුණු රු.2,151,206 ක නඩු ගාස්තුව අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 දක්වාම නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වී නොතිබුණි.

(ඈ) අඹේවෙල ගුවන්විදුලි විකාශනාගාරය ඉදිකිරීම සඳහා 1984 වර්ෂයේදී රජය විසින් නුවරඑළිය හා වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අයත් අක්කර 30 ක පමණ භූමි ප්‍රමාණයක් වෙන්කර දී තිබූ නමුත් බදු ගිවිසුමක් මගින් නීත්‍යානුකූලව මෙම භූමිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දක්වාම යෝජිත කාර්යය සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. මෙම භූමි ප්‍රමාණයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති අක්කර 6 ක පමණ භූමි කොටස සඳහා බදු ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර තිබියදී ප්‍රාදේශීය ලේකම් විසින් "විදුලංකා" නමැති පෞද්ගලික ආයතනයකට මෙම ඉඩමේම කොටසක් බදු දීමට කටයුතු කර තිබුණි. තවද වැලිමඩ ප්‍රාදේශීය ලේකම්ට අයිති ඉතිරි අක්කර 24 ක පමණ භූමි ප්‍රමාණය සඳහා බදු අයිතිය ලබා ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබූ අතර, සංස්ථාව විසින් ඉඩමේ ඇති සංචාරක බංගලා දෙක පමණක් පවත්වාගෙන ගොස් තිබුණි.

(එ) එෆ් එම් සම්ප්‍රේෂණාගාරයක් ඉදිකිරීම සඳහා 1990 වර්ෂයේදී රු. 50,000 කට මිලදී ගෙන තිබූ හෙක්ටයාර් 1.503 ක වපසරියකින් යුත් කලටුවාවේ පිහිටි ඉඩම විගණන දිනය වූ 2018 සැප්තැම්බර් 3 දින දක්වා යෝජිත කාර්යයට යොදවා නොතිබුණි. එයින් පර්චස් 19.77 ක කුළුණක් ඉදිකර ලංකා බෙල් ආයතනය විසින් 2011 වර්ෂයේ සිට භුක්ති විඳිමින් පැවතියද ඒ සඳහා මාසිකව රු.15,000 බැගින් ගෙවීමට එම ආයතන එකඟ වී තිබුණද මේ දක්වා නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹීමට නොහැකි වීම නිසා 2011 වර්ෂයේ සිට ආයතනයට ලැබිය යුතු බිම් කුලී ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඒ) නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් සමඟ ඇති කර ගත් තිස් අවුරුදු බදු ගිවිසුමකින් ලබා ගෙන තිබූ නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනය දරන දේපළේ බදු කාලය 2015 ඔක්තෝබර් මස අවසන් වී තිබූ අතර එදින සිට දේපළේ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු වුවද එය නොසලකා 2015 ජුනි 01 දින සිට අවුරුදු තුනක කාල සීමාවකට මාසයකට රු.290,000 ක බදු කුලියකට නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා ගැණුම්කරුවකුට බද්දට දී තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදු කුලිය රු. 725,000 විය. මෙලෙස සංස්ථාවට හිමිකමක් නැති දේපළක් බදු දීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය විය.

(ඔ) ගුවන් විදුලි සේවා ස්වයංක්‍රීයකරණ සඳහා 2008 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී එකතුව රු.3,212,113 ක මුදලක් වැය කර තිබුණ ද, 2017 දෙසැම්බර් වන විටද එම සේවාවෙන් ලැබිය යුතු පහසුකම් ලබාගැනීමට හැකි වන පරිදි එම මෘදුකාංගය ක්‍රියාත්මක වී තිබුණේ සේවා 03 කට පමණි. මෙනිසා මෘදුකාංග ලබා ගැනීමට විශාල මුදලක් වැය කර තිබුණ නමුත් බොහෝ කාර්යයන් මේ දක්වා ස්වයංක්‍රීයකරණය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඕ) ගුවන් විදුලි සංස්ථාවට අයත් අක්කර 125 ක සීදුව ඉඩමෙන් පර්චස් 10 බැගින් වූ කැබලි 1027 ක් ගුවන් විදුලි සංස්ථාවේ එකඟත්වයකින් තොරව 2000-2001 කාල පරිච්ඡේදය තුළ කටාන ප්‍රාදේශීය ලේකම් විසින් ජනතාව අතර බෙදා දී තිබුණි. 2018 සැප්තැම්බර් 3 විගණන දිනය දක්වාම ඉඩමේ අයිතිය සංස්ථාව සතුව පැවතුණද වන්දි අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ක) 2016 ඔක්තෝබර් 19 දින සිට 2016 ඔක්තෝබර් 27 අතර දිනක ආරක්ෂක අංශය භාරයේ තිබියදී බලාගාර අංශයේ භාවිතයේ තිබූ රු. 425,000 වටිනා පවර් ලොගර් මිණුම් උපකරණය අස්ථානගත වී තිබුණු අතර, ආරක්ෂක අංශයේ කට උත්තරය අනුව මෙම යන්ත්‍රය එම අංශය තුළ තිබියදී අස්ථානගත වී ඇති බව සනාථ වී තිබියදීත් සිදුවූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් 2018 සැප්තැම්බර් 05 විගණිත දින වන විටත් අයකරගෙන නොතිබුණි

**7. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | (i) සංස්ථාවට විසින් මිලදී ගෙන ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබාගැනීමට කටයුතු නොකිරීම.<br>(ii) සංස්ථාවට හිමි භුක්ති විදින ඉඩම් ආරක්ෂා කරගැනීමට නොහැකි වීම හා ඉඩම් විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගෙන නොතිබීම.<br>(iii) සංස්ථාවට හිමිකම ඇති භුක්ති නොවිදින ඉඩම් බාහිර පාර්ශවයන් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන සිටීම .<br>(iv) ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව සත්‍යාපනය කර නොතිබීම.<br>(v) ස්ථාවර වත්කම් බොහොමයක පිරිවැය හා පවත්නා ස්ථානය වෙන වෙනම හඳුනාගත නොහැකි වීම නිසා පැරණි වත්කම් බොහොමයක් විකුණා තිබුණත් ඒවා පොත් වලින් ඉවත් කර නොතිබීම.<br>(vi) වාහන පිළිබඳ භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබීම. |
| (ආ) ලැබිය යුතු ගිණුම් | (i) වර්ෂ 42 කට වඩා පැරණි ණය ශේෂ අය නොවී පැවතීම.<br>(ii) ණයගැති පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසදීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) තොග පාලනය | (i) තොග ආගණනයේදී හඳුනාගත් තොග ඌනතා හා අතිරික්තයන් සමීක්ෂණ මණ්ඩලය විසින් වාර්තාගත කර නොතිබීම.<br>(ii) තොග අයිතම පිළිබඳ දත්තයන් පරිගණකගත නොකිරීම නිසා තොග වාර්තා ලබා ගැනීමට වැඩි කාලයක් ගතවීම. |
| (ඈ) ගෙවිය යුතු ගිණුම් | (i) ණයහිමි පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසදීමට කටයුතු කර නොතිබීම.<br>(ii) වසර 02ත් 10 ත් අතර නොගෙවූ උපචිත වියදම් පැවතීම හා එම උපචිත වියදම්වල වගකීම් කාලය ඉක්මවා ඇති හෝ තථ්‍ය වගකීමක් නොමැති වියදම් විශ්ලේෂණය කර නිරවුල් කිරීමට කටයුතු නොකිරීම.<br>(iii) බදු වගකීම් හා වර්ෂයට අදාළ බදු නිසි පරිදි හඳුනාගෙන එම බදු වගකීම් නිසි දිනයට නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හා එම හිඟ බදු මත අධිභාර ගෙවීම සිදුවීම. |

| | | |
|---|---|---|
| (ඉ) | කාර්යය මණ්ඩල පරිපාලනය | (i) බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබීම.<br>(ii) අනුමත නොවුණු තනතුරු සඳහා දිගින් දිගටම බඳවාගැනීම නිසා සේවක අතිරික්තයක් ඇතිවීම.<br>(iii) විධිමත් පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් තනතුරට අවශ්‍ය නියමිත සුදුසුකම් නොමැති අය අවලංගු කරන ලද සම්මුඛ පරීක්ෂණ මත බඳවා ගැනීම. |
| (ඊ) | ගිණුම්කරණය | (i) සංස්ථාවේ ගිණුම්කරණ ක්‍රමය යාවත්කාලීන කර නොතිබීම.<br>(ii) වත්කම්, වගකීම්, ආදායම්, වියදම් ගිණුම්වල ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය වීම.<br>(iii) ගිණුම්කරණයේදී ප්‍රධාන මූලාශ්‍ර ලියවිල්ලක් වන ජර්නල් වවුචර්වල අංක, වටිනාකම්, සංලක්ෂය සඳහන් කිරීමේදී අඩුපාඩු පැවතීම. |
| (උ) | ප්‍රසම්පාදන | (i) සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම.<br>(ii) විකාශනාගාරයක් නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවක් පැවරීමේදී අඩුපාඩු සහිතව කටයුතු කර තිබීම. |